# ලන්ඩන් කවි
LONDON KAVI

2 Queens Parade, Green Lanes, London, N8 0RD
Tel: 020 8347 6211, Fax: 020 8341 5905, Email: kavi@londonkavi.com
Free Circulation - Vol 1 Issue 6  July - August 2004


## පන්තියේදි ඉස්සූ අත

ප්‍රශ්නයක් නැගූ විට,
පිළිතුරක් ඉස්සුණා
පොඩි අතක් ඉස්සුනා ................................

ඉදි රතු පාටවුණ ගහක කොළයක් මෙනා
පොඩි අතක් පණපෙවී සෙලවෙනා
කන්ද උඩ දිය බුබුල විලසිනා
ඇඟිලි තුඩු බුද්ධියෙන් බැබලෙනා
පොඩි අතක් පණ පෙවී සෙලවෙනා-සෙලවෙනා
නිරන්තර මා සිතේ රඟ දෙනා

පොඩි ළමයේ
පන්තියේදි ඉස්සූ අත,

පෙරමුණ යන අත් වැලකට තව අතක්ය
හෙට දවසේ ඉරුට පුදන මල් දමක්ය
අලුත් ලොවට උඩු සුළඟේ කොඩි වැලක්ය
අතු අග පලවැල සොයන්ඩ ඉනිමගක්ය
නිවී අඳුරු දිග ගමනේ ගිනි සිලක්ය

පන්තියේදි ඉස්සූ අත
පොඩි ළමයෝ
මම සිඹිමී!

□ පරාක්‍රම කොඩිතුවක්කු



### දීඝායු කුමරුනි. ...

| | |
|---|---|
| අස්සරේස් නරඹන්නට නායක දෙයුවල ම | ගොසින් |
| ළඟ නොබලා දුර බලනට සිතුණේ දීඝායු | ලෙසින් |
| නිඳිමත බැහැ පෙන්නන්නට ඒ වුණාට වැසුණු | ඇසින් |
| ප්‍රශස්ති ගී ගායනාව අගමැතිගේ බිරිඳ | විසින් |

---

පසුගිය කලාපයේ මුල් පිටුවේ කවියට
ලංකාවෙන් තැපෑලෙන් එවූ පිළිතුරක්....

| | |
|---|---|
| වෙසක් දිනේ සිල් ගත්තේ නිවන් දකින්නයි | පුතු නේ |
| දම්පදයෙ දහම් වදන් තේරුව මගේ රන් | පුතු නේ |
| අපි නං දැන් නිවන් පුරේ කියන්න බෑ එහි | වරු නේ |
| පින්තූරෙට වහන් නොවී නිවන් පුරට එනු | පුතු නේ |

□ බදුල්ලේ මෛත්‍රී රත්නායක

'ලන්ඩන් කවි' කාර්යාලයට ගොඩවුණු මහින්ද රත්නායක මිතුරා මේ පිළිතුරු කවිය දැක ක්ෂණික ව පහත සඳහන් කවිය කොළයක කටුගා ගියේ ය.

| | |
|---|---|
| නිවන් දකින්නට සිතමින් අට සිල්ගත් | ආත්තේ |
| දම් පදයේ වදන් සොයා දෑස වෙහෙසු | ආත්තේ |
| නිවන් පුරේ ඉන්නා බව කවියෙන් කිවු | ආත්තේ |
| නිවන් පුරේටත් ලන්ඩන් කවි එනවද | ආත්තේ |

## .... සැම දුකය ....

| | |
|---|---|
| දුක නම් දුකය දුක ඇත මා | හතරවට |
| කුමට ද සිතෙයි හැලහැප්පිලි දිවිය | මට |
| ජීවනමගේ හැපෙමින් කුමකට ද | සිට |
| හිතෙනව හොඳයි මිය යන එක | අකාලෙට ..... |
| දිවයයි දිවෙන ලොව අප ව ද | පෙරලගෙන |
| නැත කිසි මඟක් නැගිටින්නට | උදව්වෙන |
| 'හත්විසි වසක්' ආවත් මඟ | ගෙවාගෙන |
| හිමි වී නොමැත අභිමිය ගත | වෙලාගෙන ..... |
| මොන දේ උනත් ඉම්මා සිත සතුටු | කර |
| කම්පා නොවෙමි ඇත මා දුක ප්‍රගුණ | කර |
| දෛවය ගෙනෙන බාධක වැට කඩොළු | හැර |
| ඇවිදිමි අනාගතයට හිස කෙළින් | කර ..... |
| වැටි වැටී කෙළින් වී යන විට | ඉදිරියට |
| ලැබුණොත් ලැබෙයි නොලැබුනමුත් කමක් | නැත |
| ඉපිදී මියෙන මේ සුළු කාලයට | අප |
| හිමි කරගෙන මොටද ගෙනයා නොහැකි | බර ..... |

□ දිලිප් චාමින්ද කත්‍රිආරච්චි
පැරිසිය.

# මාලදිවයින

කිරිසුදු වැලිවලින් වටවුණු දිවයින ක
නිසසල ගතිය රැඳි සුව ඇති නිවහන ක
නිහඬ ව සිටින විට එක් මැදියම් රය ක
මනසෙහි මෝදුවිය නෙක සටහන් මත ක

ඇළ දොළ වැව් ළිං හෝ කඳු ගැට නොමැතී
දූපත් තිබේ දහසක් රජයට අයතී
සංචාරක පිරිස් මෙහි නිරතුරු සරතී
වැඩි ආදායමක් ඒ අයගෙන් ලැබෙතී

ඉන්දිය මුහුදු කුමරිය ගෙල වට බැඳුණු
මාලෙකි මාලදිවයින් අටොලින් සැදුණු
නෙක වයිවරණ මාළුන් දස අත පිරුණු
නොගැඹුරු මුහුද රසගොමුවක් හිත ඇඳුණු

හැම දූපතක් වටකොට ඇති වැලි පලස
දිස්වෙයි සුදෝ සුදු හිම ඇතිරුව විලස
සුදු යුවතියෝ හිඳ විඳිනා හිරු පහස
කිරිමෝරුන් වගෙයි ගොඩගත් මස් පිණිස

දිය බංගලා කණුමත ගොඩ නඟන ලද
වෙසසක් තිබේ ඒ දිය මිල වැඩි වුව ද
වීදුරු කවුළුවෙන් පොළොවේ සාලෙ මැද
මාළුන් පෙනේ පොදිකන හැටි එළිය වැද

මාලෙ අග නගරයයි නිවහන් පිරුණු
මෙය දූපතකි හැම තැන ජනයා රැඳුණු
පටු පාරවල් ඇත පිරිසිදුවට තැනුණු
සල්පිල් තිබේ පිටරට බඩු ගොඩගැසුණු

පෙර අය බීවෙ රැස් කරගෙන වැහි වතුරයි
යන්තර මුහුදු දිය දැන් මිරිදිය කරවයි
මව් බස 'දිවෙහි' යනුවෙන් කවුරුත් හඳුනයි
අක්සර 'තාන' එම හෝඩියෙ විසි හතරයි

රට වැසියන් හැමට ඇත්තේ එකම දැයයි
වහරන බස එකයි අදහන දහම එකයි
එබැවින් ගැටුම් කලබල කිසිවකින් තොරයි
දියුණුව දිනෙන් දින ඇතිවන ලකුණු පෙනෙයි

ශ්‍රීපාලි වයිමන්, මාලදිවයින.

# පැරණි සීපද

රන් මාලය පැළඳගෙන ගත සුව්පුල්ලා
ඉන් ආලය වඩයි මගෙ සිත නුඹ පල්ලා
පන් දහසක් කල් තැබුවත් උඩ එල්ලා
රන් භාජනය නොවිඳි ද විඳිනා ගුල්ලා

## එක ම කවියා එක ම ස්ත්‍රියට කී කවි තුන

(ඇලපාත මුදලි විසින් ගජමන් නෝනාට)

උවනත දිලිසෙනා පානා සඳෙසෙ මනා
සියොගත බබළනා නානා රුවිනි මනා
සිහිවත පියොමනා නූනා අදර ගුනා
මගෙ සිත වෙහෙසෙනා නෝනා මෙනුඹ ගැනා

යනුවෙන් ආදරය අපේක්ෂිත අවස්ථාවේ දී ද,

සසඳර මන නන්ද බඳුවද මකුළින් ද
යුගතන පිරි කුන්ද ගණරන් කුඹුමෙන් ද
මතවර වර නින්ද සසොබන මන නන් ද
කත නුඹ ළඟ නින්ද නොලැබුණෙ පවකින් ද

යනුවෙන් ආදරය නොලැබී ගිය අවස්ථාවේ දී ද

ලොව රස අහර නැත්තෙන් ගොන් තණ කත් ද
දිය කුස ඇති නිසා වැ ලී ඇද වෙත් ද
නුඹෙ දොස නැතැයි මට කුමකට ගරහත් ද
මගෙ දොස නිසා නුඹ දැන් වෙසඟන වෙත් ද

යනුවෙන් ආදරය ලැබී අවසන එපා වූ විට ද එක ම කවියා එක ම කාන්තාව කෙරෙහි දැක්වූ ආකල්පය පැහැදිලි ව ම අවබෝධ කරගත හැකි ය.



## උපාධිකාරයා

පියා නොමැති කල අම්මා වෙහෙස දරා
සැමවිට මගේ සැප සම්පත අගය කළා
අනාගතය කිරියෙන් ඉතිරෙන්න කියා
උසස් ඉගෙනුමට සරසවියකට ගියා

උපාධියක් ලැබගෙන තේජස නං වා
දහසකටත් වඩා ඉල්ලුම් පත් දැම් මා
රැකියා කොයිද? නැහැ එකපිළිතුරක් ප වා
සංකර සමාජය හෙළ බස විසුණු ක ළා

මොනවා කරන්න ද දිවි මඟ රැක ගන් න
සිදුවුණි ගාඩ් යුනිෆෝමය පල දින් න
බලගතු නිලධාරියෙක් සේ ගිනි අව් වේ
මුර කොටුවකයි මා වැඩ කර කල් ගෙව් වේ

බෙන්ස් කාර් එක හැම විට යන එන වා
'බොස් කාරයා' දපනය ආ මරවන වා
සැලියුට් ගසා මා ඔහු වෙත දිව යන වා
ඔහුගේ සිතුම මුහුණින් එළියට එන වා

සරසවි උපාධිය ලැබගෙන උගත් වෙලා
ඇයි මෝඩයෝ මෙතනම උඹ ගාඩ් වෙලා
පුදුමයි අම්මපා සිතුවිලි කොල්ලන් ගේ
පොල්කුඩු මිසක් නැහැ කිසි මොළයක් මුං ගේ

අනේ සර් නැහැ ඔබ හට වැට හීම
මගෙ හදවතට නම් තව නැහැ සැනසී ම
සලකා බලා හැකිනම් මගෙ ඉගෙනී ම
දෙනවද මටත් කන්තෝරුවෙ පත්වී ම

තිලක් ප්‍රනාන්දු, ලන්ඩනය.

# අම්මේ ඔබ ගේ උපන් දින දා තෝකියෝවේ සිට

කළ යුතු වූ පෙර දිනෙක - අතපසු වූවකට යන මෙන්
උදෑසන වැඩ මුරයට - ලහියේ දුවන
මුකවාඩම් බැඳි සුදු දනන් - සුවහසක් අතරේ
අඩ සියවසක නැණ රැළි උපන්
වතක් දකිනා හැම වාරේ
මම ඔබ ව දකිනවා අම්මේ......

උදැසන නිඳි ලොවින් පිබිද - කවුලුවෙන් ලොව දකින වේලේ
සියොත් නෙක නොදුටු මුත් - 'බොන්සායි' තුරින් සැරසූ
මාගලක් වත් තරම් නැති - පුංචි ගෙමිදුල අමදින
කතක් දකින හැම වාරේ
මම ඔබ ව දකිනවා අම්මේ......

සවස 'ෂින්තෝ' අරමක - පෙට්ටියට කාසියක් විසිකර
අත්තල ගසා දෙවියන් කැඳවන - හුදෙකලා මවුන් සරණා නගරේ
'කිමෝනෝවේ' අණසකට - කෙටි පියවර තබා ඇවිදින
අහම්බෙන් හෝ සිනාසෙන
මුවක් දකිනා හැම වාරේ
මම ඔබ ව දකිනවා අම්මේ....

ඉතින්......
ආත්මය 'පැකට් කර' විකුණා - සිරුරු යන්තර කරගත්
අපායේ දෙව්ලොවක් තනනා
වඳුරන් ගෙන් උපන් මුත් - සුදුම සුදු මිනිසුන් ගෙන් මිදී
ඔබ ගෙ උපන් දින දා පන්සලට යන්නට
මටත් එන්න හිතෙනවා අම්මේ.......

© එස්. එල්. සෙනෙහෙධීර, ලන්ඩන් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයය.

# නූතන රබන් පද

තාක්ක දොන් දොන් තාක්ක දොන් දොන්
තේක්ක ගස් කපලා
දිගෙක යන්නට ලෑස්ති වෙන මට
ගේකට බඩු හදලා

බීක්කු තිය තිය ඔහොරිය වට කොට
තේක්ක මල් මහලා
රාක්කයේ පිරි හිස් බෝතල්වල
පැණි පොල්තෙල් පිරිලා

තාච්චි තියන්න නැකත ලබන කොට
ආච්චි ගෙට වැඩලා
උණු කැවුම් ඉදිලා
ඒ රස සුවඳට
කෝඳුරුවොත් එන්නා ....
බොලංසකි කෝඳුරුවොත් එන්නා

වීත්තෙ ඇඳගෙන නැකැත් බලාගෙන
නැන්දා ගෙට එන්නා
මල් වැහි මැද්දෙන් බාල මස්සිනා
දොරකඩ හිනැහෙන්නා

තාප්පෙ සුදු හුණු තීන්ත ගාලා
ගේ කලඑළි වෙන්නා
සාක්කු හිස් වී බහින කලාවට
අපි අතිනත ගන්නා
දොං දොං දොං අපි අතිනත ගන්නා

© නිතිඥ සුනේත්‍රා වනිගසේකර

# මුකුලිත වූ මහනෙල

ගෙදර එන විට රෝහලෙන්
ඔබේ දෑස වෙනුවෙන්ම
පණ ගන්වා
හැඩ ගන්වා
අතු ඉතිද පීරුවා සේ
පිරියම් පිරූ ගෙමිදුල
බලා සිටින්නා සේය
ඔබ ළඟට එනතුරා

එදා මහ රෑ හදිසියේ
අමතකව ගිය ඇඳ පාමුල
මිරිවැඩි සඟළ
දෙපා පහස ලත් ඔබගේ
බලා සිටින්නා සේය
යළිත් ලැබෙන තුරු
ඔබේ පිය පා පහස....

දුරකථනය අසල
කුරුටු ගා ඇති ඔබ අතින්
ඉලක්කම් අතර
තිබේද කිසියම් අංකයක්
යළිත් ඔබ ඇමතිය හැකි?

(මානෙල් ජයසේන පසුගිය දින අපෙන් සමුගත්තා ය. අගෝස්තු මස 15 ඉරිදා ලක්බිම පුවත් පතේ හෙන්රි ජයසේනයන් අතින් ලියවුණු දීර්ඝ කවියකින් කොටසක් මානෙල් ජයසේනයන්ට උපහාර ලෙස මෙසේ උපුටා පළ කරමු.)



# Russell Square

*Still Stranded in*
*Her Majesty's land*
*I sit in the park*
*Lost in confused thoughts*

*It is D- day today*
*Every TV channel*
*Carrying news of the D - Day*
*Reminiscing veterans*
*Laden with heavy, rusty medals*

*I feel light - with no cross to bear*
*Seated under a lofty Elm*
*Meditate as spring arrives coyly*

*A distraction - Suddenly*
*A Pair of pigeons -*
*Black and Gray*
*Black one leads the Gray one*
*Then flies away*
*Leaving the Gray one behind*
*Heart broken*

*Spring in the park*
*Green and copper leaves*
*Flowers of many hues*
*Yet not close enough*
*To feel the scent*

*Perhaps, my last spring*
*At the Russell Square*
*Distracted, desperate and desolate*
*Mind*
*Floats in the blank sky*
*Searching for the black pigeon*
*That flew away*
*Abandoning the Gray one*

*Dragging stiff legs along*
*Collecting reluctant thoughts*
*I move out*
*To go home*
*To watch D - Day parades*

© Udaya Prasanta Meddegama
University of London.

# මල්ලී ගෙන් ශ්‍රී ලංකාවේ දී ය.

අයියගෙ දිගු ලිපිය ගිය සතියෙදි ලැබුණා
දුව ගෙන ඇවිත් කවුරුත් ලිපියට එබුණා
සට සට ගාල අම්මාගෙ කඳුලක් වැටුණා
සමහරු කරුණු ගැන හරියට දුක හිතුණා

ලන්ඩන් විත්ති ඇසුමට යාහළුවො ආවා
තොරතුරු අසා සිටියා සෙනෙහස ගාවා
නවතා ගන්න බැරිවිය සිනහව වාවා
සුබ මංගලම්! යයි පවසන්නට කීවා

අපෙ කැම්පස් එකත් මේ දිනවල වහලා
වැස්ස වැඩි නිසා මේ පැත්තට ගලලා
කුඹුරු යායට ම අපි මා වී ඉහලා
ගිය සතියේ බැන්ද මගේ පත්තියෙ සරලා

නංගිත් හොඳයි නිතරම පාඩම් කරන
මෙහෙකාරිත් ගියා ගෙයි වැඩපල කරන
මාමා නිතර ඔබ ගැන සිහිපත් කරන
තාත්ත ගෙන් ඇත අපහට නිසි සරණ!

වැඩිපුර ලියැන්නැයි යාළුවෝ ඉල්ලනවා
අම්මා අහනවා ඕනැ ද වෙන මොනවා
කැම්පස් නැති නිසා දවලුත් නිදියනවා
සමහර දිනක අයියා හීනෙන් එනවා

තව දුරටත් ඉගෙන ගත්තොත් නරක නැහැ
හොඳ තොප්පියක් දා ගත්තට කමක් නැහැ
ආදායම් සරුයි අඟ - හිඟ මොකුත් නැහැ
ලන්ඩන් එන්න මට නම් උවමනා නැහැ

සුද්දියො නම් කොහොමටවත් බඳින්නෙපා
පවුලේ ගරු නම්බු අමතක කරන්නෙපා
තාත්ත ගේ එවදන් කඩ කරන්නෙපා
බුදු සරණයි! නො ලියා නම් ඉන්නඑපා

- සුමනා අදිකාරි
එන්ෆීල්ඩ්.


## ලන්ඩන් කවි

සංස්කාරක - අනුර හැගොඩ
Editor - Anura Hegoda
සංස්කරණ සහය - යසිරු සමරකෝන්
මලිත් හැගොඩ
අනෝමලී - අනුත්තරා
Editorial - Assistance Yasiru Samarakoon
Malith Hegoda
Anomali - Anuthara
වෙබ් අඩවි නිපැයුම - කසුන් පලන්සූරිය
Web Design - Kasun Palansuriya


# කොයිබ සිටන් එන්නේ ඇල්ලි මැල්ලියේ

එක්තරා කාලයක රුහුණේ ප්‍රාදේශීය රජ කෙනෙකු වූ පැරකුම් රජුට ඉතා රූමත් දියණියක් සිටියා ය. ඇය නමින් නවරත්න වල්ලි නම් විය. ඇ විසින් කරනා ලද යම් නොපනත් කමක් නිසා දැඩි සේ කිපුණු රජු ඇයට දිය හැකි ඉතා ඉහළ ම දඬුවම ලෙස රොඩී රැහැනට ඈද දැමීම කළේ ය. ඉතින් මේ ලෙස රොඩී බවට පත් වූ ඇය රුහුණේ සිට කැලණිය බලා එන අතර පාරතොටේ සිටියවුන් ඇගේ රූපයට බැඳී ඇය ගෙන් නොයෙක් ප්‍රශ්න නඟන්නට වූහ. මේ ඇයට රොඩී රැහැට පත්කළ සැටිත් ඇය ගේ ගමන පිළිඳවත් ඇය ගේ දුකත් ජනකවියා දුටු අයුරුයි.

උඩමලේ උඩ සක්මන් කරන ලියේ
බිම මගේ බිම සක්මන් කරන ලියේ
එක රියකට සළු දොළසක් අඳින ලියේ
රොඩී රැහැට බැහැපන් රත්නවල්ලි යේ

පියාණන් එසේ පවසා රොඩී රැහැට පත්කළ රත්නවල්ලිට මඟ දී හමුවූ අයෙක් ඇය කුල කාන්තාවක් බව දැන කවුද යන්න විමසීමට මෙසේ ඇසුවාලු. මෙහි පළමුවන සහ තුන්වන පැදි ඒ පුද්ගලයා ද දෙවන සහ සතරවන පද නවරත්න වල්ලි විසින් ද පැවසිණ.

කොයිබ සිටන් එන්නේ ඇල්ලි මැල්ලි යේ
රුහුණ සිටන් එන්නේ ඇල්ලි මැල්ලි යේ
දෙපය ආපු ගිගිරිත් සෙල්ලි සෙල්ලි යේ
පැරකුම් රජු ගෙ දුව නවරත්නවල්ලි යේ

අනතුරුව ඇය තමා ගේ දුක මෙසේ පැවසුවා ය.

උඩ මාලේ උඩ සක්මන් කරපු මට
බිම මාලේ බිම සක්මන් කරපු මට
එක රියකට සළු දොළසක් ඇඳපු මට
කෙසේ කළ යාද පලු වීර ගස් යට

(අන්දරේ මේ කවිය තමන් ගේ දුක පැවසීමට යොදාගත්තේ ය. එහෙත් එහි නියම හිමි කාරිය නවරත්නවල්ලී යැයි අපට හැඟේ)

මීළඟ කලාපය සඳහා
ඔබගේ නිර්මාණ
ලන්ඩන් කවි
**2 Queens Parade**
**London N8 ORD**
වෙත යොමු කරන්න.

# රංචාගොඩ ළමයා



මාතර කඹුරුගමුවේ ඉපදී රුහුණේ ම කල් ගත කරමින් ජීවිතයේ සෑම අංගයක් ම කවියකට හරවා දුක සැප එකසේ කවියක් කරගත් රංචාගොඩ ළමයා නමැති කාව්‍යක්කාරිය ඇයගේ කාව්‍ය සංකල්පනා උපහාසාත්මක ලෙස ඉදිරිපත් කිරීමෙහි ලා කාව්‍ය ක්ෂේත්‍රයේ කිසිවෙකුට දෙවැනි වූයේ නැත.

ඇගේ ජීවිතය ඉතා දුක් කම්කටොළුවලින් පිරිගියක් විය. හේන් ගොවිතැන ජීවිකාව කරගත් ඇයත් සැමියාත් ඉතා දුකින් කල් ගෙවූ බව මේ කවෙන් පළට වේ.

හේනේ පැලේ තනියම ඉන්නා කලට
කොකෙක් ඇවිත් ඇඬුවයි මගෙ ඊසානේ
බඩගින්නේ බැරුව මගෙ පණ යන්නාය
තොටත් මටත් එක දුකමයි කොකෝ කොකෝ

කොතෙක් දුක් කරදර පැමිණිය ද ඇය සැමියා පිළිබඳ ව දැක්වූ ආදරය වෙනස් වූයේ නැත. ඔහු රැක දෙන්නැයි ඇය සැම දෙවියන්ගෙන් ම ඉල්ලා සිටියා ය.

මෙහෙව් රටේ රංචාගොඩ ඉපදීලා
රුහුණු රටට මා දීලා උලව්වේ
කහට පොතු තකා කට හම යන්නාය
හැම දෙවියනේ මගෙ වාහේ රකෝ රකෝ

කෙසේ වෙතත් අද්‍යත් සමහර කාන්තාවන් මුහුණපානා අන්දමේ අත්දැකීමකට රංචාගොඩ ළමයාට ද මුහුණ දීමට සිදු විණ. එනම් වැලිගම සිට පැමිණි කාන්තාවක් තම සැමියා ගේ සිත ගැනීමට උත්සාහ ගැනීමයි. මේ පිළිබඳ ඉතාමත් වේදනාවට පත් ඇය මෙවෙලේ නැති කවියෙන් ඇති පලේ කුමක් දැයි සිතා වැලිගම කාන්තාව විනාශ කිරීම සඳහා මේ ලෙසින් වස් කවියක් බැඳ ගැයුවාලු.

මෙතෙක් කලක් යහතින් කාපු දීගේ
වැලිගමියෙක් ඇවිදින් කරපු හදියේ
පරුමානයක් සේ අරගෙන ගහ උඩට
රීරි යකොයි කාපන් කැවුතු ඇද ඇද

වැලිගම කාන්තාවට මොනවා සිතෙන්න ඇද්ද? දැනෙන්නෙ නැද්ද?

දිනක් රංචාගොඩ ළමයා සමඟ දබර වූ සැමියා ඇය ව අතහැර දමන බවට හෙවත් නැවත ගමට ඇරලවන බවට කඩමණ්ඩියට ගොස් කරුණු පවසා තිබිණ. මෙය දැනගත් දින ඇය සැමියා ගෙදර එනතෙක් නොඉවසිල්ලෙන් බලා සිට මෙසේ කවි හරඹයක් ඇරඹී ය. ඇගේ පදය කීවේ ඇදලා ය. සැමියා ගේ උත්තර සාමාන්‍ය කතාවෙනි.

රංචාගොඩ : හැබෑද ඕයි මං අරිනව කියන්නේ
සැමියා : ඔව් බොල මොකද ඉතිං කියන්නේ
රංචාගොඩ : එහෙමද කීවෙ මා කැන්දාගෙන එද්දී
සැමියා : එහෙනං කොහොමද බොල කීවෙ
රංචාගොඩ : කීවේ රංචාගොඩ ළමයා මැණිකෙ කියා
සැමියා : අපොයි මෙහෙම මැණිකක්, වරෙන්කො වඩාගන්න
රංචාගොඩ : වඩාගන්නටත් හැදුවේ නැද්ද එදා
සැමියා : කවද්ද බොල
රංචාගොඩ : මතක නැද්ද කැන්දාගෙන ආ දවසේ
සැමියා : අපොයි මෙහෙම කටක්... මං යනව යන්න
රංචාගොඩ : අයියෝ අනේ යන්නම යනවා ද අනේ
සැමියා : නෑ නොගොහිං නිකං ඉන්නවා
රංචාගොඩ : යනවා නං කුඩේවත් දීලා පලයෝ
සැමියා : දෙනව තොට කුඩ මිටෙන් එකක්

රසවත්කමින් අනූන රංචාගොඩ ළමයාගේ කවි ජීවිතය කවිකාමීන් අතර කිසිදා අභාවයට යන්නේ නැත.

## ආදරය ද නැත්නම්.......

තමන් ආදරය කළ කාන්තාව පතලේ මිහිරන් තල තලා සිටිමින් අහලපහළ සිටි පිරිමි දෙස බලා ඉඟි කරමින් සිටි අයුරු ඉවසාගත නොහී පතල ඉතා ගාම්භීර තැනක් යනුවෙන් පෙන්වා ඇගේ ඔමරි නැවැත්වීමට ජනකවියා උත්සාහ කළ ආකාරය ද මේ?

**මිහිරන් තල තලා ඉඳගෙන සිතු පිරිය**
**විපරන් කර බලයි වටපිට බෝ සරිය**
**මිතුරන් වැඩිවෙලා නුඹටත් ආදරිය**
**නොකරන් ඔමරි පතලයි මේක මේරිය**

## ON A LAWN IN MAHARAGAMA



On a lawn I relax on a rattan lounge
Reading ANTON CHEKHOV and sipping vintage Arrack
I hear, as usual, SEETHA NONA'S well - winch Creak
Engaged in her evening's ablutions
A Scent of jasmine pervades
The sunset - sky is streaked with fleeting clouds,
reflecting brilliant purples, scarlets and golds,
All the day's clamour and its urgency has gone,
midfully relegated till tomorrows dawn
On a rambuttan - tree, parrots squawk and squabble,
The last of their day's forays.
Humming - birds invade a passion fruit bower.
A chameleon cocks a protruding, stalking eye at me
Twilight: squadrons of fruit - bats weave across the sky.
Higher up a flight of duck honk - V - shaped, Bound for nesting sites
Cicadas begin their shirll incessant drones.
The mellow notes of a dinner - gong summon me indoors

Denis Jansz
(London)

## ජීවිතය

ඉපදේ මනු සතුන්
දමා උඩුවියන් පාවඩ
රජවේ අයෙක්
යදී සිඟමන් තවකෙක්

බැබලේ රජ රටේ
පොරකද්දී ධන පතියන් මුදල් හා
පාතාලේ රජා වැජඹේ පාතාලේ
වදී බැටේ බතටත් දුගී පැලේ

බලවතා මෙලොවේ
කරයි වැරදි දහසක්
නඩු හදා නඩු දිනා
සමාව දී

හතිවැටේ දිනන්නා
පරදින්නා හා සමඟ එකලෙස්
මරු අතවනන බව සැමටම
බැරි වළක්වනු කිසිවෙකුට

වැළලේ ඇති ව උඩුවියන්
වැළලේ ඇති ව පාවියන්
එහෙත්
ගලන ඕජස් රස
විදී පණුවන් පොර කකා

එස්. එෆ්. හනීෆ්ඩීන්
මාලිගාවත්ත.

## මුත්තයියා මුරලිදරන්

මිහිපිට ක්‍රිකට් රන් මිණි කිරුළ හිමි
මුරලි ඔබට රට වෙනුවෙන් තුති පුදමි
ඔබ විහිදෙව් ක්‍රිකට් යස රැස් කිරණ සොමි
දිරි පුතු ඔබයි එළි කළ රට අපට හිමි

සුද්දන් සැලෙයි නොනැවතී දැක ඔබ ගෙ බලේ
සුදු හම උඩට ගන්නට හැම දේ ම කළේ
දිරි ගෙන ඔබයි පෙන්වූ ඇවසි බලේ
පලයෙන් පිරුණු ගසටයි ගල් වදිනු මලේ

නිහතමානි ඔබ පෙන්වූ මුරලි ගරු
ඔබ විස්කම් දැක සුද්දන් දකිති තරු
කඩුලු දාහ ගත්තොත් ඔබ දින නුදුරු
එම කඩයිම කවුරුන් හෝ කඩනු බොරු

දූෂණ, භීෂණයෙන් පිරි මගේ රට
යුක්තිය, කුමක් දැයි නොමදත් මගේ රට
ක්‍රිකට්වලින් ඔබ දිදුලුවා මගේ රට
මතු භවයෙත් ඔබ ඉපදේ මගේ රට

සුපුන් ප්‍රියන්කර විජේතුංග
ලන්ඩන් මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලය.

## රන් රුව

සඳපායා නිල් අහ සේ
වටකුරුවට ඉර වා ගේ
ඉරපායා නිල් අහ සේ
වටකුරුවට සඳ වා ගේ

හිම ඉසිලා හතර වටේ
සිහින් පුළුන් රැලි වාගේ
දොරකඩ ළඟ නතර වෙලා
මුකුලිත වී සිත මාගේ

රන්වන් වන් රන් රුවක් වෙලා
නොමවද මා හද අර ණේ
හැර නොමයන ලෙස කිසි දා
සුසුමක් වී ඔබ රැඳු ණේ

අවසන් වර සමුගත් දින
දොරකඩ ළඟ සිට ලා
සිනා සිසී ඔබ ගිය හැටි
පෙනේ ය මට මැවි ලා

ඔබ මාගෙන් වෙන් වූ බව
ඇසුණේ මිතු හඬකින්
දුරකතනය වෙත යැවු ණේ
විසිරී ගිය මනසින්

ජංගම දුරකතනය ඔබෙ
නැතිවූයේ කොහෙදෝ
මිහිරි හඬක් තිබෙන ළඳක්
අහුලාගෙන නොවෙදෝ

සඳ පායා මුදුනට එන වෙලාවට
හිරු බැහැලා අවරට යන වෙලාවට
රන්වන් එරන් රුව වැඩි ඒ වෙලාවට
දෑසම රිදෙයි දොරකඩ ඉඳ බලාසිට

ශ්‍යාමිණී මොනරවිල
කැන්ටබරි.



පාතකඩ

# නුවර පෙරහැර

ස  ව් කෙලෙසුන් නසා බිඳ බවයේ  අඳුර
ලො ව් තුරු මහිමි වැඩ සිටි පතුරා  සොඳුර
පෙ ව් සුර නරන්හට දම් අම මී  මදුර
දෙ ව් රම් වෙහෙර වාගෙයි 'දළදා  මැදුර'

ද ස  දෙසා යවා බොදු හඬ සිහල  පර පුරේ
බැස  මහ මඟට සිව් සුර රජුන්  මුර කෙරේ
ප ස  තුරු නදින් මැද මහනුවර  පුර වරේ
ව ස  රට වරක් බුදු පෙරහරට  දොර ඇරේ

ක ල  බල නොවන ගජකුඹුමත මුතු  කුඩ ය
මු ල  ටම මඟ දෙපස කස පුපුරන  හඬ ය
ලෙල  දෙන නටන පන්දම් වැට හරි  හැඩ ය
ද ළ  දා වඩින බොදු අතැඟිලි හිස  උඩ ය

උ ඩ  රට - සබරගමු - බෙරහඬ පහත  රට
හ ඬ  දෙයි තැනින් තැන රංගන තනුව  කට
හැ ඩ  වැඩ කාර නැටුමෙන් දඟ සුළුව  සිට
න ඩ  යෙන් නඩය නැට්ටුවො යති ඉදිරි  යට

බ ස්  නායක නිළමෙ දළදා හිමි  බාර
වෙස්  ගෙන මහ රජිඳු ලෙස ලැබ උප  හාර
ප ස්  සෙන් නිලමෙවරුනුත් ගෙන සහ  කාර
ල ස්  සන කරයි බුදු පෙරහර යන  පාර

ස ම්  බුදු දන්ත දා කරඬුව පිදුම්  ලබා
ම ං  ගල ඇත් රජිඳු ගේ පිට උඩින්  තබා
සෙ ං  කඩ ගල නුවර විහිදා කැළුම්  පබා
පෙන්  වයි මහා සෙනඟට අති උතුම්  සොබා

කාලෙට  දාතු බුදු පෙරහැර බලන  ඉවේ
දී ම ට  සිසිල් ගුණයක් ලැබ අමිල  සුවේ
තාලෙට  වැදෙන බෙර පදයෙන් නැටෙන  කවේ
නාදෙට  තරඟ වැල් පෙරළෙයි නුවර  වැවේ

දු ර  සිට නුවර ගොස් සඳහම් අමොද  බිබී
න ර  ඔන රිසින් බුදු සිරි අවසරය  ලැබී
ව ර  කට වුව ද මහ සෙනඟක් අතර  එබී
පෙර  හැර නොබැලූ දෑසක් මොනවට ද  තිබී?

८ කිවිපති පාතකඩ කුලතිලක

අගෝස්තු 2004 ලන්ඩනයේ දී.



# ස්වර්ණමාලිය අඟනක් විය

සතුටින් බෙලෙන් වැඩ සිටි තෙළඹුවක  ලි යේ
මල් පිබුදුණි ඔබ සියුමැලි රුවට  ලි යේ
මුණිඳු දමින් පින් පිරි දේවතාවි  යේ
නිරිඳු බසට රැවටුණු ස්වර්ණමාලි  යේ

ගසට පසෙක ගැබ බඳවනු බැරිද  ලි යේ
එම විට ඔබට මුනි වඳිනට හැකි ය  ලි යේ
පෙර සිට රජුන් කී බොරු ඇයි ඇසුවෙ  ලි යේ
යන එන මඟත් නැති වූ ස්වර්ණමාලි  යේ

පින් ඇති ගසක් නොම විය යාබදක  ලි යේ
තැවී සොවින් ඇති විය කෝපයක්  ල යේ
පවින් වෙලී අසරණ වී ලොවට  බ යේ
මහමඟ රඟන අඟනකි ස්වර්ණමා  ලි යේ

८ සපුමල් බණ්ඩාර, ලන්ඩනය.

# මිතුරියනේ

අරලිය පොකුරක මල් පෙති  අතරේ
නුඹලාගේ රුව මා සිත  වැතිරේ
අරලිය පොකුරේ සුසුවඳ  අතරේ
නුඹලාගේ සුසුවඳ හද  පැතිරේ

විහඟුන් කිචි බිචි ගී ගයනා  විට
සමනළයින් මල් රොන් සොයනා  විට
කුඹි රැළක් කඩිමුඩියේ යන  විට
අපගේ සුන්දර ලොව සිහිවේ  මට

එක්වී සමඟින් දැනුම සෙවූ  සැටි
හසරැලි සයුරක අප කිමිදුණු  සැටි
අපගේ මිතුදම තව වැඩිවූ  සැටි
මතකෙට එනවා රැඟුම් රැඟූ  සැටි

සිත අද්දර හිඳ සුව සෙත  සැදුවා
සැනසුම සමඟින් දැනුමත්  බෙදුවා
ඒ සුන්දර ලොව මතකේ  හිඳුවා
සමුගත් කෙටිකල තනිකම  සැදුවා

මිතුදම යදමක් සේ සවි  වෙනවා
කවදා හෝ අප වෙන්වී  යනවා
මතකය සැමදාමත්  පවතිනවා
අරලිය සුවඳක එය  පාවෙනවා

එක් කඩ ඉමකදි වෙන්වූ  මොහොතක
පාළුව තනිකම හද රැඳි  සමයක
මතකය නොමියෙන සදා  කාලයක
සුමඟුල් මතකය ලියවේ  කවියක

८ දුලාංජලී සිරිවර්ධන
12 ශ්‍රේණිය, ශ්‍රී සුමංගල බාලිකා විද්‍යාලය, පානදුර.



# මොනිකා

## රුවන් කිවි ලිය

කොලොම් පුර සිට
රුහුණු රට ගිය
නෝන ගජමන් එදා කිවි ලිය
ධූම රථයෙන් දකුණු රට සිට
කොළඹ එන්නට
යළි උපන්නෙද

සපනස් විය ගෙවා
කෙටි දුරක දිවි හළ
ගජමන් නෝනා හට
වැඩිදුර ලියනු බැරි වී

එකුන් විස්සක් කවි පොත්
පබැඳුම් කළා ඔබ
එකුන් සැට වියෙහිම
නිමා කොට තුටු මෙහෙවර

දුක් මුසුවක ගිලුණු
ගජමන් කිවිලියට
පාතේ ජන වරම
ලියන පිං මඳ විය

ශ්‍රී රුහුණෙන් ම ආ
රුවන් කිවිලිය ඔබ
සියොළාලා ගැන
සියඥ්ඥිලා ගැන
උන්ගෙ වැත්තෑ ගැන
ලියූ කවි නල වැද
දෙනිපිටි නුග සැලේ අද

"ලියූ කවි දහසකින්
කියාගත නොහැකි වූ
යමක් හදරුවා ගෙන
ගැහැනියක් නිඳයි මෙහි"

එසේ නොකියනු මැන
ගැහැනුන් දහසකට
කියාගත නොහැකි වූ
සිතුම් මුහුදකි ඔබ මැවූයේ

නොනැමිය ඔබ දණ
නොමකීය දුක් ගී
ලියන්නට කල් දෙව
මාර දෙව් පුතුට ද
අබිමන් පෑය ඔබ

ඔබ හුන් තැන උස්ය
පිරවිය නොහේ අන් හට
ගියද දිලිසෙන දෙපයින්
වෙන්වනු බැහැ ඔබෙන්
අනේක ජාති සසරේ
හමුවේය ඔබ ඔබෙ කවි.

පරාක්‍රම කොඩිතුවක්කු

## නික්ම ගිය කෙවිලිය

නික්ම ගිය කෙවිලිය
දළබිසෝ ලීලාවති රජින
සරුසාර කළ හෙළ කවි උයන
වැඩුවා මවක සේ ඇය පෙමින
මා තොටින් ආ ගජමන් නමින

ඇගෙ ආත්මය රුහුණෙන් පැමිණ
අගනුවර සිප්සත ලැබ නොමින
කෙවිලියක විය කව් පද බඳින
මොණිකා රුවන් පතිරණ නමින

ගම් නියම් ගම් දුර ගව් සියය
මිනිසුන් සොයා ගිය කිවිඳියය
හඬනැති උනට හඬ වූ ඇයය
ඔරෝ යෙහෙළියය ඇය ගැයැනියය

කිරි කපන දළු නෙළනා අතට
දරුවඩන උන් නළවන හඬට
දුන් අරුත් සරු කවියක් ඇයට
ලැබුණි ද කවර ඉසුරක් ඇයට

මේ දිවිය බුබුලෙක පිනි බිඳෙක
වන මලෙක පිබිදුණ වන රොදෙක
කළ මෙහෙය පවතී හදවතක
නොමැකී සුවඳ පිළිබඳ මතක

රත්න ශ්‍රී විජේසිංහ

---

## සිතුවම

ඉවතලා කටුක වූ යුෂ බිඳුව
දිවි බඳුන හිස්කර
පියවරක් ගෙන පෙරට
හැරී බලන්නී
හැරදා ආ සිරුර දෙස

සුදු සැටින් කැන්වසය වසා ඇඳි
සිතුවමකි වත
අවසන් මොහොතේ වත්
සිනාසෙනු නොහැකි වූ

ගලා ගිය හෙයින්
ජීවය ද ජවය ද
ලියූ කවි තුළට
නිශ්චලය කෙසඟය සිරුර
අඳුරුය මුහුණ

ලියූ කවි
නොවැළපෙන බව දැක
තුටු සිතින් ඇදෙන්නී
අපැහැදිලි ඉවුරකට

ලාල් හැගොඩ

ලන්ඩනයේ රඟදැක්වූ 'චරිත හතක්' නාට්‍යයට දායක වන්නට පැමිණි කවියා ලන්ඩනයේ දී හමු වූ මිතුරන්ට ස්තුතියි කියාත් ඊට වඩා වැඩි යමකුත් ලියා යැව්වේ මෙ සේ ය.

## ලන්ඩන් මිතුරාට

බලා එන්ට මගේ පිරිවර
සිතී ඉසව් සත් මුහුදු පසු කර
එන්ට බෑ ඉතිං ඒ ගැන
දුකයි යාළුවේ ......
නෙතට නොදැකුනත් ඉඳහිට
හදවතින් බිඳක් කවිකර
එවන්නට ඉතින් අවසර
ගුවන් ගැබ දිගේ ....
පන්සියක් වසර ගණනින
කඳවුරුත් ලලා තැන තැන
අපේ මව්බිමේ සාරය
රැගෙන ගිය බිමේ .....
අළුත් අදහසක් මවමින
අපේ හඬ රැගෙන ආ දින
දුටිමි නුඹේ නෙතු අද්දර
පැතුම් පොදි මැවී .....
ගෙන ගොසින් ලොවේ තැන තැන
දැමූ මුත් අපේ අරමුණ
දළු ලලා වැඩෙන බව නම්
දැනුණි සුව දිදී .....
එසේ වී නමුදු ම'මිතුර
යා යුතුව තිබේ බෝ දුර
අපට හිමි අපේ මාවත කටු කොහොල් දිගේ .....
මඟ හසර කියා දෙන්නට
කෙනෙකු වුව නැතිව හිටි මම
තනිව මඟ සොයා ඇවිදින්
සහාගත වුණේ ....
දුෂ්කරයි වුව ද මේ මඟ
මිරි අරන් ඔබේ වදනින
අත් නෑර යන්ට අදිටන
අලුත් වැහි දිගේ ....
නඟන්නට ලොවේ ඉහළට
මගේ මව් බිමේ කිත්යස
වෙහෙස වෙන මිනිස් යායක්
අතර හිඳිමිනේ ....
පිළි අරන් ඔබේ ඇරයුම
අපි ඇවිත් ඔබේ හිත් ළඟ
නොමියන මතක සටහන්
තබා පැමිනුණේ ....
ජීවයක් සමඟ දිරියක
මාවතක් සැදූ වග ඔබ
පසක් කරන්නම් මතු දින
සොහොයුරාණනී ....
'ස්තුතියි' කියනු බෑ මට
බිඳින්නම් පැරණි අදහස
ලියා තබන්නම් නොමැකෙන
මතකයක් දිගේ ....
සමුගන්න ඇවිත් කාලය
ඉතිං අවසරයි පිය සඳ
අලුත් ඉරක් යට හමුවෙමු
මනුසත් උයනේ ....

ප්‍රේමරත්න තෙන්නකෝන්
කළුතර දකුණ,